# 10 ශ්‍රේණිය - නර්තනය

2020 - 111 වාරය

- නිපුණතාව - 5.0

  ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

- නිපුණතා මට්ටම - 5.2

  ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

- කාලච්ඡේද - 02

- ඉගෙනුම් පල -

  නර්තන ශිල්පිණියන් පිළිබඳ ජීවන තොරතුරු රැස්කරයි.

  නර්තනයේ ප්‍රවර්ධනයට දායක වී ඇති ආකාරය විස්තර කරයි.

  ඔවුන්ගේ සේවය ඇගයීම සම්බන්ධව අදහස් දක්වයි.

  පරපුරෙන් පරපුරට ඔවුනට දැක්විය යුතු කෘතවේදීත්වය පිළිබඳව යෝජනා ඉදිරිපත් කරයි.

- ක්‍රියාකාරකම - 5.2.1

## නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු

### ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය



ශ්‍රී ලංකාවේ බිහිවූ දක්ෂ නර්තන ශිල්පිනියන් අතර ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මියට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. 1932 මාර්තු මස 15 වන දින උපත ලද මෙතුමිය පාසල් අධ්‍යාපනයෙන් පසු චිත්‍රසේන කලායතනයෙන් නර්තනය හැදෑරුවා ය. පසුව ඇය දක්ෂ නර්තන ශිල්පිනියක ලෙස කිරුලු පැළඳූ අතර ඇයගේ ජීවන වෘත්තිය වූයේ ද නර්තනය යි. වයස අවුරුදු 19 දී ඇය **"කුමුදුනී"** නමින් ළමා මුද්‍රා නාට්‍යයක් නිෂ්පාදනය කරමින් ළමා මුද්‍රා නාට්‍ය කලාවක් දේශයට හඳුන්වා දීමේ ගෞරවය හිමිකර ගත්තාය. 1949 වසරේදී චිත්‍රසේනයන් විසින් රචනා කළ රාවණා, කරදිය, නළ දමයන්ති ආදී මුද්‍රා නාට්‍ය සඳහා නර්තනයෙන් දායක වූවාය. කරදිය මුද්‍රා නාට්‍යයේ සිසීගේ චරිතයටත්, නළදමයන්ති මුද්‍රා නාට්‍යයේ හංස ධේනුවගේ චරිතයටත් පණපොවමින් ඇගේ සුවිශේෂ නර්තන ප්‍රතිභාවන් ලොවට හෙළි කිරීමට වජිරා මහත්මියට අවස්ථාව ලැබුණි.



ටී.ඒ.කේ. ගුණසේකර
ගුරු උපදේශක - නර්තන



1951 වසරේදී සුප්‍රකට නර්තන ශිල්පී චිත්‍රසේනයන් සමග විවාහ ගිවිස ගැනීමෙන් පසුව ඇයගේ කලා ජීවිතයට නව ජීවයක් ලැබුණි. කාන්තාවට උචිත නර්තන විලාසයන් සමග උඩරට නැටුමේ තාණ්ඩව හා ලාස්‍ය ලක්ෂණ ඉස්මතු වන ආකාරයට ප්‍රසංග වේදිකාවේ නර්තනය ඉදිරිපත් කිරීමේ සුවිශේෂ හැකියාවක් වජිරාවන් සතු විය. ඒ නිසාම එතුමිය ප්‍රේක්ෂකයින් අතර ජනාදරයට පත් වී ඇත.

- කාර්ය පත්‍රිකාව 01

කලා ශිල්පිණියන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි/ පින්තූර රැස්කර ගන්න. තව දුරටත් තොරතුරු ඇතුළත් කරමින් කුඩා පොත් පිංචක් සකස්කර ඔබේ පන්ති පුස්තකාලයට එකතු කරන්න.

- කාර්ය පත්‍රිකාව 02

ඔබට දී ඇති තොරතුරු හොඳින් කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

01. ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය ශිෂ්‍යාවක ලෙස නර්තනය හදාරනු ලැබුවේ කවුරුන් යටතේද?

02. ඇය විසින් නිර්මාණය කරන ලද ළමා මුද්‍රා නාට්‍ය කුමක්දැයි සඳහන් කරන්න.

03. වජිරා චිත්‍රසේනයන්ගේ නර්තන ශෛලිය තුළ දක්නට ලැබුණු සුවිශේෂ ලක්ෂණ මොනවාද?

04. කරදිය සහ නළදමයන්ති මුද්‍රා නාට්‍යයන් සඳහා ඇය දායකත්වය සැපයූ චරිත දෙක වෙන වෙනම සඳහන් කරන්න.

05. නර්තන කලාවේ ප්‍රවර්ධනයට සුවිශාල මෙහෙවරක් කරන ලද ශිල්පීන් වෙනුවෙන් කෘතවේදීතාවය දැක්වීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන යෝජනා දෙකක් කෙටියෙන් සඳහන් කරන්න.



ටී.ඒ.කේ. ගුණසේකර
ගුරු උපදේශක - නර්තන

## ආචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මිය





1938.11.15 වන දින කැලණියේ දළුගම ග්‍රාමයේ උපන් මෙතුමිය පාසල් අධ්‍යාපනයෙන් පසු රජයේ ලලිත කලායතනයෙන් නර්තන විෂයය හදාරන්නට වූවාය. කොළඹ ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් ලබා ගත් ඇය භාරතයේ අඩයාර් හි ‘’කලා ක්ෂේත්‍ර’’ නම් ආයතනයෙන් භරත නර්තන සම්ප්‍රදාය හදාරා 1966 දී පෙරළා ලංකාවට පැමිණ ශ්‍රී ලංකාව තුළ භරත නාට්‍ය සම්ප්‍රදාය ප්‍රචලිත කරන්නට කටයුතු කරමින් නර්තන ශිල්පිනියක ලෙස ද ප්‍රසිද්ධියට පත් විය. 1984 වසරේදී ඇය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂවරිය ලෙස පත් වූ අතර එම ධූරය හෙබවූ ප්‍රථම කාන්තාව ලෙස මිරැන්ඩා හේමලතා මහත්මියට හිමිවන්නේ ඉමහත් ගෞරවයකි. ඇයේ දූපුතුන් උදෙසා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ පෞරුෂය නගා සිටුවීමට ඇය ඉතා කැපවීමෙන් කටයුතු කළාය.

සමස්තලංකා නැටුම් තරග ක්‍රමවත්ව හා විධිමත්ව ආරම්භ කිරීම, අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන කණ්ඩායමක් ආරම්භ කිරීම වැනි කටයුතු ඇයගේ මග පෙන්වීමෙන් ක්‍රියාත්මක විය. ගිරාගම සෞන්දර්ය ගුරු අභ්‍යාස විද්‍යාලයේ හා කටුකුරුන්ද ගුරු අභ්‍යාස විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ නර්තන විෂය උගන්වන ගුරු භවතුන්ට තම ශිල්පය ලබා දුන්නා පමණක් නොව මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යක්ෂවරිය ලෙස ද කටයුතු කළාය. මෙහිදී ඇයගේ මග පෙන්වීම යටතේ සෞන්දර්ය විෂයයන්ගේ උන්නතිය වෙනුවෙන් යුගයට අවශ්‍ය පරිදි සංවර්ධනය කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කළ බව ද කෘතවේදීව සිහිපත් කළ යුතුය.

- ගුරුවරුන් සඳහා ගුරු අත්පොත් සකස් කිරීම.
- පාසල් පද්ධතියට සුදුසු පරිදි විෂය මාලාව සකස් කිරීම.
- ගුරු මාර්ගෝපදේශ සැකසීම.
- සෞන්දර්ය ගුරු භවතුන් පුහුණු කිරීම.
- විෂයයට අදාළව සම්මන්ත්‍රණ පැවැත්වීම.
- අ.පො.ස. (සා. පෙළ) සහ අ.පො.ස.( උ.පෙළ) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සැකසීම.

ප්‍රායෝගික ඇගයීම් විධිමත්ව සකස් කිරීම. ආදී කටයුතු රැසක් ක්‍රියාත්මක කිරීමට ඇය මූලිකත්වය ගෙන කටයුතු කළාය. පාසල් පද්ධතියේ කටයුතුවලින් බැහැරව ලේඛන කලාව පිළිබඳ අවධානය යොමු කොට විෂයට අදාළව පොත්පත් සහ ලිපි රැසක් රචනා කරමින් දක්ෂ ලේඛිකාවක ලෙස ද ප්‍රසිද්ධියට පත් විය. ‘’තණ්හා ආශා’’ නම් වූ ඉගි නලුව නිර්මාණය කිරීමත් ඇය අතින් සිදු වූ තවත් මෙහෙවරකි.



ටී.ඒ.කේ. ගුණසේකර
ගුරු උපදේශක - නර්තන




1980 දී **"මෝල්ගස් නැටුම"** වේදිකාවට සුදුසු පරිදි ප්‍රාසාංගික නර්තන අංගයක් ලෙස සකස් කිරීමේ ගෞරවයෙන් ද ඇය පිදුම් ලබන්නීය. දැයේ දරුවන් වෙනුවෙන් දේශීය නර්තනය මෙන්ම භරත නැටුම් හැදෑරීම සඳහා "මිරැන්ඩා හේමලතා කලා ආශ්‍රමය" ආරම්භ කොට දරුවන්ගේ කලා හැකියාවන් වර්ධනය කිරීමෙහි ලා නර්තන ප්‍රසංගද පැවැත්වීමට ඇයට හැකියාව ලැබුණි. පසු කාලීනව එතුමිය විසින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඒකරාශි කොට ඔවුන්ගේ කලා කුසලතා ඔප් නංවමින් එම දරුවන් සමාජ ගත කිරීමට කටයුතු කරන්නීය. ඇයගේ කැපවීම හා සුවිශේෂ හැකියාවන් නිසා 1985 දී <u>**සොන්ටා ජාත්‍යන්තර සම්මානයත්**</u>, 1988 දී <u>**කලාසූරී ජනාධිපති සම්මානයත්**</u>, <u>**ජාත්‍යන්තර කාන්තා දින සම්මානයත්**</u> සෞන්දර්ය කලා විශ්ව විද්‍යාල නර්තන හා නාට්‍ය කලා පීඨය මගින් පිරිනමන ලද <u>**දර්ශනශූරි උපාධියත්**</u> ලබා ගැනීමට තරම් සුදුසුකම් ලබමින් එතුමිය සමස්ත කලා ක්ෂේත්‍රයටම වටිනාකමක් එක් කරන්නීය.

## ➢ කාර්ය පත්‍රිකාව

හිස් තැනට සුදුසු පිළිතුරු සපයන්න.

01. 1938 වසරේ ........................... ග්‍රාමයේ දී මිරැන්ඩා හේමලතා මහත්මිය උපත ලැබුවාය.
02. ඇයට භරත නාට්‍ය සම්ප්‍රදාය හැදෑරීමට අවස්ථාව ලැබුණේ....................... ආයතනයේ දීය.
03.............................. නර්තනය ප්‍රසංග වේදිකාවට උචිත පරිදි නව රංග රටා මවමින් සකස්කිරීමේ ගෞරවය මිරැන්ඩා හේමලතා මහත්මියට හිමි විය යුතුය.
04. නර්තන කලාවේ ප්‍රවර්ධනයෙහි ලා විශාල මෙහෙවරක් කළ මිරැන්ඩා හේමලතා මහත්මිය.............................දී කලාශූරී ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබීය.
05. 1966 දී භාරතයේ සිට ආපසු පැමිණි ඇය .................. නම් ඉගි නලුව නිර්මාණය කොට ප්‍රසිද්ධියට පත් විය.
06 ඇය විසින්..........................ආරම්භ කොට ශ්‍රී ලාංකික දරුවන්ට දේශීය නැටුම් මෙන්ම භරත නැටුම් හැදෑරීමට අවස්ථාව ලබා දීම නර්තනයේ උන්නතිය වෙනුවෙන් කරන ලද මහඟු සේවාවකි.

## ➢ කාර්ය පත්‍රිකාව 02

- දේශීය නර්තන කලාවේ ප්‍රගමනය වෙනුවෙන් ආචාර්ය මිරැන්ඩා හේමලතා මහත්මියගෙන් ලැබුණු දායකත්වය අගයමින් පුවත් පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.



ටී.ඒ.කේ. ගුණසේකර
ගුරු උපදේශක - නර්තන